ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය - 2017
First Term Test – 2017

06 ශ්‍රේණිය
Grade 06

ගණිතය I
Mathematics I

පැය දෙකයි
Two Hours

I කොටස

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) උතුර හා නැගෙනහිර දිශාව අතර පිහිටි අනු දිශාව නම් කරන්න.

(2) 134 + 53 සුළු කරන්න.

(3) ප.ව. 1.30 වේලාව සම්මත ආකාරයෙන් ලියා දක්වන්න.

(4) පහත වස්තු වලින් වෘත්තාකාර හැඩය දැකිය හැකි වස්තු තෝරා යටින් ඉරක් අඳින්න.
1. දාදු කැටය 2. ටයරය 3. ක්‍රිකට් පිත්ත 4. කෝදුව

(5)



a) කුඩාම සංඛ්‍යාවට හිමි අක්ෂරය .... වේ.

b) විශාලම සංඛ්‍යාවට හිමි අක්ෂරය .... වේ.
සංඛ්‍යා රේඛාව ඇසුරින් ඉහත හිස්තැන් දෙක සම්පූර්ණ කරන්න.

(6) පන්ති කාමරයක ටයිල් (පිඟන් ගඩොල්) ඇල්ලීමට ටයිල් කැට 95 ක් අවශ්‍ය වෙයි. එවැනි පන්ති කාමර 10ක ටයිල් ඇල්ලීමට අවශ්‍ය ටයිල් කැට ප්‍රමාණය නිමානය කරන්න.

(7) 3 005 100 250 මෙම සංඛ්‍යාවේ මිලියන කලාපය කොටු කර දක්වන්න.

(8) සෘජුකෝණ එකක් <u>පමණක්</u> හා පරාවර්තන කෝණ එකක් <u>පමණක්</u> ඇති ඉංග්‍රීසි කැපිටල් අක්ෂරය කුමක්ද?

(9) 0 , -3 , 2 මෙම සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

(10) නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ මැරතන් දාවන තරගය පෙ.ව. 8.15ට ආරම්භ විය.එම තරගයේ ජයග්‍රාහකයා වූ රවී තරගය පෙ.ව. 09.05ට අවසන් කළේය. ඔහුට තරගය නිම කිරීමට ගත වූ කාලය සොයන්න..

(11)



ඉහත සංඛ්‍යා රේඛාවේ නිරූපණය කර ඇති මිල ගණන් අනුව සත්‍යය පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. බනිස් ගෙඩියක මිල > කේක් කෑල්ලක මිල
ii. කේක් කෑල්ලක මිල > බනිස් ගෙඩියක මිල
iii. මාළු පාන් එකක මිල < බනිස් ගෙඩියක මිල
iv. කිරි පැකට් එකක මිල < මාළු පාන් එකක මිල

(12)



වෘත්තය මත පිහිටීම් දක්වෙන අක්ෂර මොනවාද?

(13)



A රූපය B රූපය C රූපය D රූපය

සරල කෝණයක් නිර්මාණය කිරීමට යොදා ගත හැකි එකතු කළ යුතු රූප සටහන් දෙකෙහි අක්ෂර ලියා දක්වන්න.

(14) 101 පහත ගණක රාමුවේ නිරූපණය කරන්න.



(15)



මෙම ඔරලෝසු මුහුණතේ දැක්වෙන්නේ ඔබ පාසල නිමවී නිවසට පැමිණි වේලාවයි. මීට පැය 1යි මිනිත්තු 30කට පසු වේලාව පැය 12 ඔරලෝසු වේලාවෙන් ලියා දක්වන්න.

(16)



මෙම කේක් ගෙඩියෙන් අට දෙනෙකුට සංග්‍රහ කළ හැකි නම්, 46 දෙනෙකුට සංග්‍රහ කිරීමට අවශ්‍ය කේක් ගෙඩි ගණන නිමානය කරන්න.

(17)



ඊතල වලින් දක්වා ඇති දිශා ඔස්සේ A සිට D දක්වා ගමන් කරන විට මුහුණලා සිටින දිශාවන් අනුපිළිවෙලින් ලියන්න.

(18) 781 + 13 = 911

```
 781
  13
 ---
 911
```

මෙම එකතු කිරීම වැරදි බව අමීෂ පවසයි. ඔබ අමීෂගේ පිලිතුර සමඟ එකඟ වන්නේ නම් නිවැරදි පිළිතුර ලබා ගන්න.

(19) A සිටින්නේ B ට උතුරු දිශාවෙන් නම් B සිටින්නේ A ට කුමන දිශාවෙන්ද?

(20) හිස්තැනට සුදුසු අගයන් කොටු තුල ලියන්න.

```
 7 5 9
   □ □
 -----
 6 6 3
```

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

පළමු වාර පරීක්ෂණය - 2017
First Term Test – 2017

06 ශ්‍රේණිය
Grade 06

ගණිතය II
Mathematics II

පැය දෙකයි
Two Hours

II කොටස

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) i. පහත වගුව සම්පූර්ණ කරන්න.

+		6	4
7	9		
8			

(ල. 03)

ii.



මෙම භාජන තුනෙහිම ඇති මුළු දොඩම් ගෙඩි ගණන කොපමණ ද? (ල. 01)

iii.



රූපයේ දැක්වෙන A හා B සිසුන් දෙදෙනාගේ උස පහළින් දක්වා ඇත.
B ට වඩා A කොපමණ උසද?

(ල. 02)

iv.



1 සිට 6 තෙක් සංඛ්‍යා භාවිත කරමින් ත්‍රිකෝණයේ සෑම පාදයක් ඔස්සේ ම එකතුව 9ක් වන සේ රවුම් වලට අදාළ සංඛ්‍යා යොදන්න.

(ල. 03)

v. ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා පළමු දිනයේ මිනිසුන් 175 දෙනෙක් ද දෙවන දිනයේ මිනිසුන් 217 දෙනෙක් ද තුන්වන දිනයේ මිනිසුන් 508 දෙනෙක් ද පැමිණියහ. ප්‍රදර්ශනය නැරඹීමේ ප්‍රවේශ පත්‍රයක මිල රු. 25 කි. දින 03 තුළ දී ප්‍රදර්ශන කමිටුව ප්‍රවේශපත් මගින් ලැබූ ආදායම සොයන්න.

(ල. 03)

02)

i. -1 ත් +1 ත් අතර පිහිටි නිඛිලය ලියන්න. (ල. 03)

ii.



A=+3, B= (-2) ඉහත සංඛ්‍යා රේඛාවේ නිරූපණය කරන්න. (ල. 02)

iii. >, <, = ලකුණ යොදා ගෙන නිඛිල සංසන්දනය කරන්න.

(a) (+5) .... (-3)

(b) (-2) 0

(c) (+4) .... (4) (ල. 03)

iv.



යම් රටක ශීත ඍතුවක උෂ්ණත්වය A අක්ෂරයෙන් ඉහත දක්වා ඇත. ග්‍රීස්ම ඍතුවේ දී උෂ්ණත්වය A ට වඩා 9 ^{0}C වැඩි වූයේ නම් එය, සංඛ්‍යා රේඛාවේ B ලෙස ලකුණු කර පෙන්වන්න. (ල. 03)

v. (-3)ත් (+2)ත් අතර ඍණ නිඛිල තුනක් ඇති බව තුෂාර පවසයි. ඔහුගේ ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ල. 03)

03)

i.

සංඛ්‍යාව	ආසන්න 10ට වැටයූ විට
38	
74	

වගුවේ සඳහන් සංඛ්‍යා දෙක ආසන්න 10ට වටයා ලියන්න.

(ල. 02)

ii. සංඛ්‍යාවක් ආසන්න 10ට වැටයූ විට 60 ලැබුණි. එය ලබා ගැනීමට තිබිය හැකි,

a) කුඩාම සංඛ්‍යාව කීයද? (ල. 01)

b) විශාලම සංඛ්‍යාව කීයද? (ල. 01)

iii. ටොපි බෝතලයක ටොපි 50ක් තිබේ. එවැනි ටොපි බෝතල් 25ක ඇති මුළු ටොපි ගණන කීයද? (ල.02)

iv.

A



මෙහි දැක්වෙන්නේ මිරිස් පැළ තවානකි. එහි A කොටසෙහි මිරිස් පැළ 86ක් තිබේ නම් මුළු තවානෙහි ඇති මිරිස් පැළ ගණන කොපමණද?

(ල. 03)

v.

විෂයය	ලබා ගත් ලකුණු
විද්‍යාව	47
ගණිතය	53
සිංහල	71
ඉංග්‍රීසි	43
මුළු එකතුව	

නිමාලි පසුගිය වාර පරීක්ෂණයේ විෂයයන් 4කට ලබා ගත් ලකුණු වගුවේ දැක්වේ. එම විෂයයන් හතරෙහි මුළු ලකුණු ගණන සොයා එය ආසන්න 10ට වටයා ලියන්න.

(ල. 03)

04)

i. පහත දැක්වෙන සංඛ්‍යාව සංඛ්‍යා කලාප වලට වෙන් කර එහි සංඛ්‍යා නාමය ලියන්න.

500903452723 (ල. 03)

ii. හිස්තැන් පුරවන්න.

i) 5 + ☐ = 16   ii) 17 - ☐ = 4   iii) ☐ × 9 = 63

(ල. 03)

iii. එක්තරා වැවක සවිකර ඇති ජල මට්ටම් මැනීමේ උපකරණයක මාස කිහිපයක දී සටහන්ව තිබූ අගයන් පහත දැක්වේ.

ජනවාරි 15 වන දින → ඒකක 12
මැයි 15 වන දින → ඒකක -2
නොවැම්බර් 15 වන දින → ඒකක 3

ඉහත ජල මට්ටම් වල අගයන් අනුව ආරෝහණ පිළිවෙලට මාස සඳහන් කරන්න. (ල. 03)

iv. පහත දැක්වෙන රූපයේ ඇති වෘත්ත ගණන කීයද?



(ල. 02)

v.



a,b හා c අතරින් මහා කෝණයක් දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල. 01)

05)

i. එදිනෙදා ජීවිතයේ දී සංඛ්‍යා රේඛාවක් දැකිය හැකි උපකරණ දෙකක් නම් කරන්න. (ල. 02)

ii. තත්පර 145, මිනිත්තු සහ තත්පර වලින් දක්වන්න. (ල. 03)

iii.



මෙම භාජන දෙකම පිරවීමට අවශ්‍ය ජල ප්‍රමාණය ml වලින් නිමානය කරන්න. (ල. 03)

iv.



a) P ගේ වයස මෙන් දෙගුණයක් Qගේ වයස වේ. Qගේ වයස සංඛ්‍යා රේඛාව මත ලකුණු කර පෙන්වන්න. (ල. 03)

b) Q ට වඩා අවුරුදු 15ක් R බාලයි නම්, Rගේ වයස කීයද? (ල. 02)

v.



එක්තරා තරගයකදී ක්‍රීඩකයන් රැඳී සිටින අයුරු පහත රූපයේ දැක්වේ. වෘත්ත දෙකම ඇතුළත සිටින ක්‍රීඩකයාගේ නම කුමක්ද? (ල. 01)

06)

i. 45 129 මෙම සංඛ්‍යාවේ,

a) 1 පිහිටි ස්ථානයට අදාල ස්ථානීය අගය කීයද? (ල. 02)

b) 5න් නිරූපණය වන අගය කීයද? (ල. 01)

. හිස්තැන් සම්පූර්ණ කරන්න.

	සංඛ්‍යාව	සංඛ්‍යා නාමය
i	345 001	....
ii	....	අසූ අට දහස් පහ
iii	2 435 000	....
iv		අට බිලියන හතර මිලියන අනූ අට දහස් හාරසියය

(ල. 04)

iii. [0], [2], [5], [8], [9] සංඛ්‍යා වලින් සුදුසු සංඛ්‍යා යොදා ගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

453 + 2 ☐ ☐ = 658

iv. නිරිත දිශාව සමඟ සෘජුකෝණයක් සාදනු ලබන දිශාව කුමක්ද? (ල. 02)

v. උතුරු දිශාව හා බටහිර දිශාව අතර පිහිටි දිශාවට ප්‍රතිවිරුද්ධව පිහිටි දිශාව කුමක්ද? (ල. 01)

07)

i. පහත දැක්වෙන කෝණ කුමන වර්ගයේ කෝණ දැයි සඳහන් කරන්න. (ල. 03)



.... (ල. 03)

ii. සුළු කෝණයක් ඇඳ දක්වන්න. (ල. 01)

iii. හිස්තැන් පුරවන්න.

a) තත්පර 380 = මිනිත්තු .... තත්පර ....

b) මිනිත්තු 210 = පැය .... මිනිත්තු .... (ල. 04)

iv. බසයකට රත්නපුර සිට බලංගොඩට යාමට මිනිත්තු 90ක් ගතවූ බව නිශාම් පවසයි. නමුත් එම බස් රථයට එම දුර යාමට පැය 01 මිනිත්තු 30ක් ගත වන බව කමල් පවසයි. ඔවුන් දෙදෙනාගේ ප්‍රකාශ පිළිබඳව ඔබට කුමක් කිව හැකිද?

v. රූපය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(ල. 04)

a) චෛත්‍යයට වයඹ දිශාවෙන් රෝදයක් අඳින්න. (ල. 02)

b) ළමයා නිවසට ගොස් ළිඳට යා යුතු නම් ඔහු ගමන් කළයුතු දිශා අනුපිළිවෙලට ලියන්න.(ල. 02)